**ඌවපරණගම ප්‍රාදේශීය සභාව**
**බදුල්ල දිස්ත්‍රික්කය**

----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මැයි 15 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 ජුනි 27 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වරයාගේ වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ඌවපරණගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ඌව පළාත් සභා අරමුදලින් ලබාගත් ණය මුදලෙහි සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණය ශේෂය රු.2,000,000 ක් වුවද, එය රු.2,750,000 ක් ලෙස දැක්වීම නිසා බැරකම් රු.750,000 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී ලැබී තිබුණු මුද්දර ගාස්තු හිඟ ආදායම් රු.1,530,466 ක්, උසාවි දඩ හිඟ ආදායම් ලැබීම් ලෙස සලකා ගිණුම්ගත කිරීම නිසා, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු හිඟ ආදායම රු.1,530,466 ක් වැඩියෙන්ද, උසාවි දඩ හිඟ ආදායම එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට වැඩ නිමකර බිල්පත් ඉදිරිපත් කර තිබුණු කර්මාන්ත 03 ක බිල්පත් වටිනාකම නොසලකා ඇස්තමේන්තු වටිනාකම් මත පදනම්ව ණයහිමි ප්‍රතිපාදන සැලසීම නිසා, සමාලෝචිත වර්ෂයේ වියදම හා වර්ෂය අවසාන දිනට බැරකම් රු.335,309 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට මන්ත්‍රීවරුන් ඉදිරිපත් කර තිබුණු සංවර්ධන යෝජනා මත පදනම්ව, වටිනාකම රු. 664,000 ක් වූ කර්මාන්ත 26 ක් සඳහා ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සැලසීම නිසා වර්ෂයේ වියදම හා දෙසැම්බර් 31 දිනට බැරකම් රු. 664,000 ක් බැගින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුළදී, පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ලබාදෙන ලද, බහුකාර්ය ජංගම කුටි 10 ක වටිනාකම වූ රු.265,000 ක් සහ දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රතිපාදන යටතේ ලබාදෙන ලද ගැල්වනයිස් කොඩි කණු 408 ක වටිනාකම වූ රු.403,316 ක් ප්‍රාග්ධනිත නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජංගම නොවන වත්කම්වල වටිනාකම හා ප්‍රාග්ධන යෙදුමට ආදායමෙන් දායකවීමේ ගිණුමේ ශේෂය රු.668,316 ක් බැගින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට, නොපියවූ අත්තිකාරම් රු.40,000 ක් මූල්‍ය ප්‍රකාශනවල නොදැක්වීම නිසා නොපියවූ අත්තිකාරම් ශේෂය රු.40,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

### 1.3.2 **නොසැසඳු පාලන ගිණුම්**

එක් ගිණුම් විෂයයකට අදාලව උපයෝගී ලේඛන අනුව ශේෂය රු. 686,458 ක් වුවත්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයට අනුව ශේෂය රු. 626,456 ක් වූයෙන් රු. 60,002 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු. 49,450,095 ක් වූ අතර, ගෙවිය යුතු ගිණුම් ශේෂ වල වටිනාකම රු.35,226,777 ක් විය.

1.3.4 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

රු. 35,414,074 ක් වටිනා ගිණුම් විෂයයන් 02 ක් සඳහා උපලේඛණ ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 **නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම්**

විගණනයේ දී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තිය | ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට ගමන් මළු සහ කුඩ ලබාදීම සඳහා රු.57,000 ක් සභා අරමුදලින් වැයකර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි | |
| | (i) මුදල් රෙගුලාසි 371 | සභාව විසින් 1991 - 2011 අතර කාල පරාසය තුල අවස්ථා 10 කදී ලබාදෙන ලද රු.686,458 ක අත්තිකාරම් 2014 දෙසැම්බර් වන විටත් පියවා නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 1646 | සභාවට අයත් වාහන 04 ක, 2014 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාල පරාසයට අදාල දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 212 හා ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 751 | සභාව වෙත ලබාදෙන ලද වටිනාකම රු.403,316 ක් වූ ගැල්වනයිස් කොඩිකණු 408 ක් තොග ලේඛණවලට හෝ ඉන්වෙන්ට්‍රි ලේඛණවලට ඇතුලත් කර නොතිබුණි. |
| (ඈ) | පළාත් පාලන කොමසාරිස්වරයාගේ 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/46 සහ චක්‍රලේඛය | සභාව සතු කඩ කාමර 77 ක මාසික බදු කුලිය චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව තක්සේරු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඉ) | 2010 මැයි 25 දිනැති අංක 04/2010 දරන විශ්‍රාම වැටුප් චක්‍රලේඛය හා ඌව පළාත් ආණ්ඩුකාරවර ලේකම්ගේ අංක 1/8/1/31(1) හා 2014 දෙසැම්බර් 08 දිනැති ලිපිය | සභාවේ ජල යෝජනා ක්‍රමවල ජල බෙදුම්කරුවන් වශයෙන් දීමනා පදනම මත සේවය කරන සේවකයින් 04 දෙනෙකු වෙනුවෙන් රාජ්‍ය සේවා අර්ථ සාධක අරමුදල සඳහා දායක මුදල් ගෙවා නොතිබුණි. |

2. **මූල්‍ය සමාලෝචනය**
----------------------

2.1 **මූල්‍ය ප්‍රතිඵල**
--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,143,360 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,219,576 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,076,216 ක අවාසිදායක විචලනයක් නිරීක්ෂණය විය.

2.2 **ආදායම් පරිපාලනය**
---------------------

2.2.1 **බදු කුලී**
--------

(අ) 2014 දෙසැම්බර් 31 වන විට සභාව සතු කඩ කාමර 10 ක් සඳහා මාස 13 සිට මාස 64 දක්වා කාල පරාසයකට අදාල හිඟ කුලී රු.118,059 ක් අයකර ගෙන නොතිබුණි.

(ආ) කඩ කාමර 08 ක් වෙනුවෙන් 1990-1996 කාලයට අදාලව පැවති හිඟ කඩ කුලී අයකර ගැනීම සඳහා නඩු පවරා තිබුණු අතර, එම නඩුවේ තීන්දුව ප්‍රකාරව හිඟ අයකර ගෙන නොතිබුණි. 2014 දෙසැම්බර් 31 දින වන විට එම කඩ කාමර සඳහා හිඟ මුදල රු.108,616 ක් විය.

2.2.2 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**
-----------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවිදඩ රු. 2,500,000 හා මුද්දර ගාස්තු රු.3,324,759 ක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) සභාවේ සේවකයින් 13 දෙනෙකු විසින් තැන්පත් කර තිබුණු රු.120,900 ක ඇප මුදල් සේවකයින්ගේ නම්වලින් බැංකු ගිණුම්වල ආයෝජනය කර නොතිබුණි.

(ආ) 2013 උපමාන පාදක සංවර්ධන යෝජනා යටතේ දවුල්දෙන ඥානේස්වර බෞද්ධ මධ්‍යස්ථානය සංවර්ධනය කිරීම සඳහා 2014 පෙබරවාරි 26 දින වානේ කම්බි හා සිමෙන්ති ලබාදීම සඳහා සභාවට රු.99,040 ක් ලබාදී තිබුණු අතර, අදාල සංවර්ධන යෝජනාව ඉටු කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ ) සභාව විසින් 2013 උපමාන පාදක ආධාර යටතේ රු.229,960 ක් ගෙවා පන්නලවෙල ජල යෝජනා ක්‍රමය සඳහා මිලදී ගෙන තිබුණු ජල මෝටරය එකී ජල යෝජනා ක්‍රමය සඳහා සවිකර නොතිබුණි.

### 3.2 නිෂ්ක්‍රිය / ඌණ උපයෝජිත වත්කම්

(අ) අංක EMDI - 120 දරණ ෆාම් මාස්ටර් අත්ට්‍රැක්ටරය අපහරණය කිරීමට හෝ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ජාත්‍යන්තර ආහාර හා කෘෂිකාර්මික සංවිධානය විසින් වියලි කලාපීය ජීවන උපායන් සඳහා සහායවීමේ වැඩ සටහන යටතේ පවුල් 200 කට ප්‍රතිලාභ ලබාදීමේ අරමුණින් රු.1,107,927 ක වියදමින් ඉදිකර, 2012 ඔක්තෝබර් 31 වන දින විවෘත කල ගොඩනැගිල්ල මේ දක්වාම ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

### 3.3 කොන්ත්‍රාත් පාලනය

සභාව විසින් 2010 වර්ෂයේ උපමානපාදක ආධාර යටතේ ක්‍රියාත්මක කළ කර්මාන්ත 03 ක් සඳහා සභා අරමුදලින් රු.274,255 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණද, සභාව විසින් ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම හා අදාල කාලසීමාව තුල කර්මාන්ත නිම නොකිරීම හේතුවෙන් සභා අරමුදලෙන් වැයකළ රු.274,255 ක මුදල පළාත් සභාවෙන් ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

## 4. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය